දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011- 2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info @psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No.: PSC/APL/6/43/2023
ඔබේ අංකය / உமது இல. / Your No.: MOJ/E4/CU/TRA2023
දිනය / திகதி / Date: 2023.12. 11

ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

**<u>අධිකරණ අමාත්‍යාංශයේ සිතාසි බෙදන්නා හා ඇස්කීසි ක්‍රියාත්මක කරන්නා, අධිකරණ සෝෂක හා ප්‍රවේශක, පිස්කල් පියන්, පිස්කල් භාරකාර මාතා සහ අධිකරණ ආරක්ෂක නිලධාරීන්ගේ 2023 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ ඔබගේ සමාංක හා 2023.09.21, 2023.10.04 හා 2023.10.20 දිනැති ලිපි හා බැඳේ.

02. අධිකරණ අමාත්‍යාංශයේ සිතාසි බෙදන්නා හා ඇස්කීසි ක්‍රියාත්මක කරන්නා, අධිකරණ ආරක්ෂක නිලධාරීන්ගේ 2023 වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණ www.psc.gov.lk දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කර ඇත.

03. ඒ අනුව 2024.01.01 දින සිට එකී ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරන ලෙසත්, නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි. එසේම මීළඟ වර්ෂයේ සිට වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී ස්ථාන මාරු පටිපාටියෙහි දක්වා ඇති කාල සටහනට අනුගතව සියළු කටයුතු කිරීමට තරයේ සැලකිලිමත් වන ලෙස ඔබ වෙත දැන්වීමටද රාජ්‍ය සේවා සේවා කොමිෂන් සභාව තීරණය කරන ලද බව කාරුණිකව දන්වමි.

04. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය දන්වා එවීමට කටයුතු නොකරනු ලබන අතර, මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

05. වාර්ෂික ස්ථාන මාරු නියෝග පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනා කිරීමට අපේක්ෂා කරන නිලධාරීන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පලකර ඇති ස්ථාන මාරුවීම් නියෝග හා ඊට අදාළ ආවරණ ලිපිය භාවිතා කර 2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධාන වලට අනුකූලව එම අධිකාරය වෙත අභියාචනා ඉදිරිපත් කළ හැකිය. එසේ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනා ඉදිරිපත් කරන නිලධාරීන්, එම අධිකාරයේ තීරණය ලැබෙන තෙක් නොසිට නව සේවා ස්ථානයේ රාජකාරි සඳහා වාර්තා කළ යුතුය.

06. වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි නව සේවා ස්ථාන වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු සම්බන්ධයෙන් එම නිලධරයා ස්ථාන මාරුව ලබා ඇති දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 (V) වගන්තිය අනුව, තනතුර අතහැර යාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

Mdayo

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**
**ලේකම්**
**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

අධිකරණ අමාත්‍යාංශයේ සිතාසි බෙදන්නා හා ඇප්කිසි ක්‍රියාත්මක කරන්නා නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අභියාචනා 2023 - රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ

| අනු අංකය | නම | වර්තමාන සේවා ස්ථානය | ස්ථානමාරු ලැබූ සේවා ස්ථානය | අභියාචනය මඟින් ඉල්ලා සිටිනු ලබන සහනය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණයට පාදක වූ හේතුව |
|---|---|---|---|---|---|---|
| 01 | ඒ.කේ. නිශාන්ත කුමාර | මාතර මහේස්ත්‍රාත් අධිකරණය | උඩුගම දිසා/මහේස්ත්‍රාත් අධිකරණය | ස්ථාන මාරුව අවලංගු කිරීම | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම | අභියාචක වසර 05 කට වැඩි කාලයක් මාතර මහේස්ත්‍රාත් අධිකරණයේ සේවය කර තිබීම මත ඔහු අනිවාර්ය ස්ථාන මාරුවීමකට යටත් නිලධාරියෙකු වීම සහ අභියාචක සමග ගැලපීම සඳහා සුදුසු අනුප්‍රාප්තිකයෙකු නොමැති වීම. |
| 02 | ටී.එම්.ප්‍රියන්ත ජයලාල් | මොණරාගල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය | මහාධිකරණය, මොණරාගල | වැල්ලවාය දිසා/මහේස්ත්‍රාත් අධිකරණය වෙත ස්ථානමාරු කරන ලෙස ඉල්ලීම | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම | අභියාචක වත්මන් සේවා ස්ථානයේ වසර 05 කට වැඩි කාලයක් සේවය කර තිබීම මත ඔහු අනිවාර්ය ස්ථානමාරුවලට යටත් නිලධාරියෙකු වීම සහ ස්ථිර පදිංචියේ සිට සැලකූ විට ස්ථාන මාරු කර ඇති සේවා ස්ථානයද ප්‍රියමනාප සේවා ස්ථානයක් ලෙස සැළකිය හැකි වීම. |

<table>
<tr><td>03</td><td>කේ.ප්‍රියන්ත උදය කුමාර</td><td>රත්නපුරය දිසා අධිකරණය</td><td>අවිස්සාවේල්ල මහාධිකරණය</td><td>ස්ථාන මාරුව අවලංගු කිරීම</td><td>අභියාචනය නිශ්ප්‍රභ කිරීම</td><td>අභියාචක වත්මන් සේවා ස්ථානයේ වසර 05 කට වැඩි කාලයක් සේවය කර තිබීම මත ඔහු අනිවාර්ය ස්ථානමාරුවලට යටත් නිලධාරියෙකු වීම.</td></tr>
<tr><td>04</td><td>ජේ.එස්. ආනන්ද</td><td>වලස්මුල්ල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය</td><td>මාතර මහාධිකරණය</td><td>ස්ථාන මාරුව අවලංගු කිරීම</td><td>වාර්ෂික ස්ථාන මාරු චක්‍රය පහත පරිදි සංශෝධනය කිරීම.<br>
<table>
<tr><th>නම</th><th>වර්තමාන සේවා ස්ථානය</th><th>නව සේවා ස්ථානය</th></tr>
<tr><td>එල්.චමින්ද පුෂ්පකුමාර</td><td>මාතර මහාධිකරණය</td><td>වලස්මුල්ල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය</td></tr>
<tr><td>ජී.ජී.ආර්. උදයංග</td><td>තංගල්ල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය</td><td>මාතර දිසා අධිකරණය</td></tr>
<tr><td>සුජීව ශාමින් අබේවික්‍රම</td><td>මාතර දිසා අධිකරණය</td><td>මාතර මහාධිකරණය</td></tr>
<tr><td>ජේ.එස්. ආනන්ද</td><td>වලස්මුල්ල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය</td><td>තංගල්ල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය</td></tr>
</table></td><td>මෙම අභියාචක සම්බන්ධ නඩුවක් මේ වන විට මාතර මහාධිකරණයේ විභාග වෙමින් පැවතීම මත සම්පූර්ණ ස්ථාන මාරු චක්‍රයම අවලංගු කළහොත් එහි සිටින අනෙකුත් නිලධාරීන් අගතියට පත්වීම වැළැක්වීම</td></tr>
</table>

<table>
<tr><td>05</td><td>රසික උපේන්ද්‍ර තිසර ගල්වත්ත</td><td>රත්නපුරය දිසා අධිකරණය</td><td>අවිස්සාවේල්ල මහාධිකරණය</td><td>ස්ථාන මාරුව අවලංගු කිරීම හෝ පැල්මඩුල්ල දිසා/ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ස්ථානමාරුවක් ලබා ගැනීම</td><td>අභියාචනයට ඉඩ ලබා දෙමින් අවිස්සාවේල්ල මහාධිකරණයේ සේවය කරන ජී. ජී. සී. එස්. ගල්හේන මහතාට මීලග වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී ප්‍රමුඛතාවය ලබා දීමට යටත්ව ස්ථාන මාරු චක්‍රය පහත පරිදි සංශෝධනය කිරීම.<br><table>
<tr><td>නම</td><td>වර්තමාන සේවා ස්ථානය</td><td>නව සේවා ස්ථානය</td></tr>
<tr><td>ජී.ජී.සී.එස්. ගලහේන</td><td>අවිස්සාවේල්ල මහාධිකරණය</td><td>වෙනසක් නැත</td></tr>
<tr><td>එස්.ඩී.ආර්.බී. සෙනවිරත්න</td><td>පැල්මඩුල්ල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය</td><td>ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණය</td></tr>
<tr><td>සනත් එලමල්දේ</td><td>ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණය</td><td>රත්නපුරය දිසා අධිකරණය</td></tr>
<tr><td>රසික උපේන්ද්‍ර</td><td>රත්නපුරය දිසා අධිකරණය</td><td>පැල්මඩුල්ල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය</td></tr>
</table></td><td>අභියාචකගේ බිරිඳ කොරෝනා රෝගය වැලදී මිය යාම මත ඔහුගේ වසර 07 ක් වයසැති කුඩා දියණියට රැකවරණය සැලසීම සම්බන්ධයෙන් පවතින මානුෂික කරුණු සැලකිල්ලට ගැනීම.</td></tr>
<tr><td>06</td><td>එම්.එම්.පී.ජේ. ආබ්දීන්</td><td>කොළඹ දිසා අධිකරණය</td><td>ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය, කොළඹ</td><td>ස්ථාන මාරුව අවලංගු කිරීම.</td><td>අභියාචනය නිශ්ප්‍රභ කිරීම</td><td>අභියාචක වත්මන් සේවා ස්ථානයේ වසර 05 කට වැඩි කාලයක් සේවය කර තිබීම මත ඔහු අනිවාර්ය ස්ථානමාරුවලට යටත් නිලධාරියෙකු වීම.</td></tr>
<tr><td>07</td><td>එස්.එම්.බී.එස්. සිරිවර්ධන</td><td>දිසා අධිකරණය, ඇඹිලිපිටිය</td><td>වාණිජ මහාධිකරණය</td><td>ස්ථාන මාරුව අවලංගු කිරීම.</td><td>අභියාචනය නිශ්ප්‍රභ කිරීම</td><td>අභියාචක විසින් ඉදිරිපත් කර ඇති වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රයේ තෙවන මනාපය වෙත ස්ථාන මාරු කර තිබීම.</td></tr>
<tr><td>08</td><td>ඩී.එම්. ගාමිණී දිසානායක</td><td>කොළඹ වාණිජ මහාධිකරණය</td><td>මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණය</td><td>ස්ථාන මාරුව අවලංගු කිරීම</td><td>අභියාචනය නිශ්ප්‍රභ කිරීම</td><td>අභියාචක විසින් ඉදිරිපත් කර ඇති වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රයේ තෙවන මනාපය වෙත ස්ථාන මාරු කර තිබීම.</td></tr>
</table>

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 09 | දනන්ජ තුසන්ත ද ලිවේරා | බණ්ඩාරවෙල මහේස්ත්‍රාත් අධිකරණය | බදුල්ල මහාධිකරණය | ස්ථානමාරුව සංශෝධනය | අභියාචනය නිශ්ප්‍රභ කිරීම | අභියාචක වත්මන් සේවා ස්ථානයේ වසර 05 කට වැඩි කාලයක් සේවය කර තිබීම මත ඔහු අනිවාර්ය ස්ථානමාරුවලට යටත් නිලධාරියෙකු වීම සහ ඔහුගේ වාර්ෂික ස්ථානමාරු අයදුම්පත්‍රයේ දෙවන සහ තෙවන මනාප ලෙස දක්වා ඇති සේවා ස්ථාන බදුල්ල අධිකරණ කළාපය තුල පිහිටා තිබීම. |
| 10 | ඩී.එම්. වේවැල්වල | ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණය | බලපිටිය මහාධිකරණය | ස්ථානමාරුව අවලංගු කිරීම | අභියාචනයට ඉඩ ලබා දීම | |
| 11 | ආර්.ඩබ්. සුනිල් රාජපක්ෂ | නුවරඑළිය දිසා අධිකරණය | හැටන් දිසා/මහේස්ත්‍රාත් අධිකරණය | ස්ථානමාරුව අවලංගු කිරීම | අභියාචනය නිශ්ප්‍රභ කිරීම | අභියාචක වත්මන් සේවා ස්ථානයේ වසර 11 කට වැඩි කාලයක් සේවය කර තිබීම මත ඔහු අනිවාර්ය ස්ථානමාරුවලට යටත් නිලධාරියෙකු වීම. |
| 12 | එච්.එම්. ලක්ෂ්මන් බංඩාර හේරත් | මහනුවර මහාධිකරණය | ගලගෙදර මහේස්ත්‍රාත් අධිකරණය | මහනුවර දිසා අධිකරණය වෙත ස්ථානමාරුව ලබා ගැනීම | අභියාචනය නිශ්ප්‍රභ කිරීම | අභියාචක වත්මන් සේවා ස්ථානයේ වසර 05 කට වැඩි කාලයක් සේවය කර තිබීම මත ඔහු අනිවාර්ය ස්ථානමාරුවලට යටත් නිලධාරියෙකු වීම සහ ඔහුව ස්ථාන මාරු කර ඇති සේවා ස්ථානයට ස්ථිර පදිංචියේ සිට ඇති දුර සළකා බැලීමේදී එයද ප්‍රියමනාප සේවා ස්ථානයක් ලෙස සැළකිය හැකි වීම. |
| 13 | ඩී.ජී.එන්. විජේවර්ධන | වාරියපොල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය | හෙට්ටිපොල මහේස්ත්‍රාත් අධිකරණය | ස්ථානමාරුව අවලංගු කිරීම | අභියාචනයට ඉඩ ලබා දීම | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 14 | ඒ.එල්.ඒ.අයි. මධුශාන් | බලපිටිය මහාධිකරණය | ස්ථානමාරුවක් ලැබී නොමැත | ස්ථානමාරුවක් ලබා ගැනිම | අභියාචනය නිශ්ප්‍රභ කිරීම | අභියාචක වෙනුවට බලපිටිය මහාධිකරණය වෙත ස්ථානමාරු කිරීම පිණිස සුදුසු අනුප්‍රාප්තිකයෙකු නොමැති වීම. |
| 15 | ඊ.වී.අයි.සමන්ත | ගාල්ල දිසා අධිකරණය | බද්දේගම දිසා/මහේස්ත්‍රාත් අධිකරණය | ස්ථානමාරුව අවලංගු කිරීම | අභියාචනය නිශ්ප්‍රභ කිරීම | අභියාචක වත්මන් සේවා ස්ථානයේ වසර 05 කට වැඩි කාලයක් සේවය කර තිබීම මත ඔහු අනිවාර්ය ස්ථානමාරුවලට යටත් නිලධාරියෙකු වීම සහ ලබා දී ඇති ස්ථාන මාරුව අවලංගු කර ගැනීමට හේතු ලෙස දක්වා ඇති කරුණු සනාථ කිරීම සඳහා වෛද්‍ය සහතික ඉදිරිපත් කර නොතිබීම. |
| 16 | කේ.පී.සුජිත් සුරංග | බදුල්ල දිසා අධිකරණය | මහියංගනය දිසා/මහේස්ත්‍රාත් අධිකරණය | ආසන්න අධිකරණයක ස්ථානමාරුවක් ලබා ගැනීම | අභියාචනය නිශ්ප්‍රභ කිරීම | අභියාචක වත්මන් සේවා ස්ථානයේ වසර 08 කට වැඩි කාලයක් සේවය කර තිබීම මත ඔහු අනිවාර්ය ස්ථානමාරුවලට යටත් නිලධාරියෙකු වීම. |
| 17 | එස්.එච්. විජිත ජයතිලක | වරකාපොල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය | කුරුණෑගල මහේස්ත්‍රාත් අධිකරණය | අයදුම් කල ස්ථානයකට ස්ථානමාරුවක් ලබා ගැනීම | අභියාචනය නිශ්ප්‍රභ කිරීම | අභියාචක වත්මන් සේවා ස්ථානයේ වසර 05 කට වැඩි කාලයක් සේවය කර තිබීම මත ඔහු අනිවාර්ය ස්ථානමාරුවලට යටත් නිලධාරියෙකු වීම සහ ඔහුව ස්ථාන මාරු කර ඇති සේවා ස්ථානයට ස්ථිර පදිංචියේ සිට ඇති දුර සළකා බැලීමේදී එයද ප්‍රියමනාප සේවා ස්ථානයක් ලෙස සැළකිය හැකි වීම. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 18 | එස්.එම්.ආර්. සිල්වා | රත්නපුරය මහේස්ත්‍රාත් අධිකරණය | පානදුර මහේස්ත්‍රාත් අධිකරණය | ස්ථානමාරුව අවලංගු කිරීමට හෝ වසරක් දීර්ඝ කර ගැනීම සඳහා | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම | වාර්ෂික ස්ථාන මාරුවීම් ඉල්ලුම් කිරීමේදී මෙම අභියාචකයාගේ ස්ථිර පදිංචිය අගලවත්ත ප්‍රදේශයේ බව දක්වා ඇති අතර ඡන්ද හිමි නාම ලේඛනය අනුවද ඔහුගේ ස්ථිර පදිංචිය අගලවත්ත ප්‍රදේශයේ බව තහවුරු වේ. ඒ අනුව ස්ථිර පදිංචියේ සිට ස්ථාන මාරු කර ඇති සේවා ස්ථානයට සැලකිය යුතු දුරක් නොමැති වීම. |
| 19 | කේ.කේ.ආර්. ප්‍රසන්න | වැලිසර මහේස්ත්‍රාත් අධිකරණය | කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය | ආසන්නම අධිකරණයක සේවය කිරීමට අවස්ථාව ලබාගැනීම | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම | අභියාචක විසින් ඉදිරිපත් කර ඇති වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රයේ පළමු මනාපය වෙත ස්ථාන මාරු කර තිබීම. |
| 20 | ඊ.එම්.ඒ.ආර්. ඒකනායක | වාරියපොල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය | මහව දිසා/මහේස්ත්‍රාත් අධිකරණය | ස්ථාන මාරුව අවලංගු කිරීම | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම | අභියාචක විසින් ඉදිරිපත් කර ඇති වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රයේ දෙවන මනාපය වෙත ස්ථාන මාරු කර තිබීම. |
| 21 | ඩබ්.එම්.එන්.එස්.එන්. වීරසූරිය | කුරුණෑගල දිසා අධිකරණය | රඹඩගල්ල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය | ස්ථානමාරුව අවලංගු කිරීම | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම | අභියාචක විසින් ඉදිරිපත් කර ඇති වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රයේ දෙවන මනාපය වෙත ස්ථාන මාරු කර තිබීම. |

| අධිකරණ අමාත්‍යාංශයේ අධිකරණ ආරක්ෂක නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු අභියාචනා **2023** - රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ | | | | | | |
|---|---|---|---|---|---|---|
| අනු අංකය | නම | වර්තමාන සේවා ස්ථානය | ස්ථානමාරු ලැබූ සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂම වෙත ඉදිරිපත් කර ඇති අභියාචනය මඟින් කර ඇති ඉල්ලීම | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණයට පාදක වූ හේතුව |
| 1 | ආර්.ඩී.පී.එස්. රංගේගම | අවිස්සාවේල්ල සිවිල් අභියාචනා මහාධිකරණය | කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණය | අවිස්සාවේල්ල අධිකරණ සංකීර්ණයේම වෙනත් අධිකරණයක් වෙත ස්ථාන මාරුවක් ලබා ගැනීම | අභියාචනය නිශ්ප්‍රභ කිරීම | අවිස්සාවේල්ල සිවිල් අභියාචනා මහාධිකරණයේ අතිරික්ත සේවක සංඛ්‍යාවක් සේවය කිරීම සහ ස්ථාන මාරු චක්‍රයේ සිටින අනෙකුත් නිලධාරීන්ට අගතියක් සිදුවීම වැලැක්වීම |
| 2 | කේ.ජී.එස්.ඩබ්ලිව්. කුමාර | අවිස්සාවේල්ල මහාධිකරණය | කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරණය | රුවන්වැල්ල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය වෙත ස්ථාන මාරුවක් ලබා ගැනීම | අභියාචනය නිශ්ප්‍රභ කිරීම | අභියාචක වත්මන් සේවා ස්ථානයේ වසර 06 කට වැඩි කාලයක් සේවය කර තිබීම මත ඔහු අනිවාර්ය ස්ථානමාරුවලට යටත් නිලධාරියෙකු වීම. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3 | එස්. යසෝතරන් | කල්මුණේ දිසා අධිකරණය | කලවංචිකුඩි මහේස්ත්‍රාත් අධිකරණය | ස්ථාන මාරුව අවලංගු කිරීම හෝ අක්කරෙයිපත්තුව දිසා අධිකරණය වෙත හෝ අක්කරෙයිපත්තුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ස්ථාන මාරුවක් ලබා ගැනීම | මෙම අභියාචකයා මේ වන විට කළමනාකරණ සේවා නිලධාරියෙකු ලෙස උසස්වීම් ලබා ඇති බව අධිකරණ අමාත්‍යාංශය මගින් වාර්තා කර ඇති බැවින් ඔහුගේ අභියාචනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සළකා නොබලන ලදී. | |
| 4 | එම්.ජී.අමිල ප්‍රදීප් ජයසිලු | ගාල්ල දිසා අධිකරණය | ස්ථාන මාරු ලබා දී නොමැත | ඉල්ලීම් කර ඇති අධිකරණයක් වෙත ස්ථාන මාරුව ලබා ගැනීම | අභියාචනය නිශ්ප්‍රභ කිරීම | අභියාචක විසින් ස්ථාන මාරු ඉල්ලා ඇති සේවා ස්ථානයන්හි පුරප්පාඩු නොමැතිවීම සහ අභියාචක සමග ගැලපීම පිණිස සුදුසු අනුප්‍රාප්තික නිලධාරියෙකු නොමැති වීම. |
| 5 | ඩබ්.ජී. අජිත් ප්‍රියන්ත | මාතර දිසා අධිකරණය | ගාල්ල දිසා අධිකරණය | මාතර අධිකරණ සංකීර්නයේ වෙනත් අධිකරණයක් වෙත ස්ථාන මාරුවක් ලබා ගැනීම | අභියාචනය නිශ්ප්‍රභ කිරීම | අභියාචක වත්මන් සේවා ස්ථානයේ වසර 06 කට වැඩි කාලයක් සේවය කර තිබීම මත ඔහු අනිවාර්ය ස්ථානමාරුවලට යටත් නිලධාරියෙකු වීම හා ස්ථිර පදිංචියේ සිට සැලකූ විට ස්ථානමාරු ලබා ඇති සේවා ස්ථානයද ප්‍රියමනාප සේවා ස්ථානයක් ලෙස සැලකිය හැකි වීම |